# අතීතයේ රජුට හිමිව තිබූ ඉඩම් අයිතිය හා බලතල පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රය භාවිතයෙන් සිදු කෙරෙන අධ්‍යනයක්

**වික්‍රමසිංහ වයි.පී.එම්.එස්,[1] දිල්හාරා පී.ඩී.ජී,[2] මදූෂානි ආර්.ඩබ්ලිව්.සී.[3]**

භූපති හෙවත් භූමියේ අධිපති සංකල්පයෙන් රාජ්‍යයේ මහජනයාගේ ප්‍රධාන නියෝජිතවරයා වූ රජුට ජනයා ආරක්ෂා කිරීමේ වගකීම හිමිවිය. රාජ්‍යයේ සියළුම බලතල හිමි රාජප්‍රකාරව රාජ්‍යයේ ඉඩම් සම්බන්ධව විශේෂ අයිතියක් රජුට උරුම විය. ඉඩම් භුක්ති රටාව රාජ්‍යයේ සමාරම්භයේ පටන් විවිධ වෙනස්කම් ඔස්සේ ක්‍රමවත්ව සංවිධානය වුවද අපට නිශ්චිත සාධක ලැබෙනුයේ ක්‍රිස්තු වර්ෂ 9 වැනි සියවසෙන් පමණ පසුවය. රාජ්‍යයේ ඉඩම් සම්බන්ධව රජුට පැවරුණු අයිතීන් හා බලතල කෙබඳුදැයි මෙම ලිපිය මගින් අධ්‍යනය කිරීම ප්‍රධාන අරමුණ වේ. මෙම අධ්‍යනයේදී මූලිකව සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයෙන් දත්ත රැස් කරගන්නා ලදි. දේශීය රාජ්‍යත්වයේ දී ඉඩම් භුක්තිය රාජ්‍යය පාලන තන්ත්‍රය සමග දැඩිව බද්ධ විය. එච්.ඩබ්ලිව්. කොඩ්රින්ටන්, විල්හෙම් ගයිගර්, එම්.බී ආරියපාල හා ටිකිරි අබේසිංහ වැනි උගතුන් ඉඩම් සම්බන්ධ රජුගේ අයිතිය පිළිබඳ අදහස් දක්වා ඇත. රජුට වගා කරනු ලැබූ සියළු ඉඩම්වලින් බද්දක් එකතු කිරීමේ අයිතිය හිමිවිය. එමෙන්ම එළි නොකළ කැලෑ ඉඩම්ද, භාවිතයට නොගත් ඉඩම්වල අයිතිය රජු සතුවිය. රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ වගාකළ ඉඩම්වල බද්දෙන් රාජ්‍යය ආදායම තරවිය. පදිංචිව හෝ අත්හැර ගිය ඉඩම් ගොඩනැගිලි සංකීර්ණ රාජසන්තක විය. මහාවිහාර නිකාය භේදයේ දී භික්ෂූන් මහාවිහාරය අතහැර ගිය විට මහාවිහාර විරෝධී සංඝමිත්‍ර භික්ෂුව "අස්වාමික ඉඩම් රජය සතුය." යනුවෙන් පවසා එම ඉඩම් රාජසන්තක කර ගැනීමට රජු පොළඹවා ඇත. ඉඩම් ප්‍රධානය කිරීමේ මූලිකයා ලෙස කටයුතු කළ රජතුමා රාජ්‍යය තුළ පැවති ඉඩම්වලින්ම කොටසක් රජ පවුලේ ප්‍රයෝජනය සඳහා වෙන් කරනු ලබයි. මේවා 'ගබඩාගම්' නමින් ව්‍යවහාර කරනු ලැබේ. රජෙකුගේ මරණයකදී හෝ රාජ්‍යත්වයෙන් නෙරපීමේදී ඔහුගේ පවුලේ නඩත්තුව උදෙසා දේපළ පැවතීම විශේෂ කරුණකි. රජකම දැරූවන්ට ද පෞද්ගලිකව අයිති වූ ඉඩම් පැවතිණි. කූටකණ්ණතිස්ස රජ පවුල සතු (කුල සන්තක) ඉඩමක් ගැන මහාවංශයේ සඳහන් කරයි. මෙම කරුණු තුළින් රාජ්‍යයේ පරමාධිකාරී බලය හිමි ආරක්ෂකයා ලෙසත් සියළු ඉඩම් සම්බන්ධව සැලකිය යුතු බලයකින් හා අයිතියකින් රජු ක්‍රියා කළ බවත් පැහැදිලි වේ. රජුගේ අභිමතය මත විවිධාකාරයෙන් එම බලය ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් ක්‍රියාවට නංවා ඇති බවත් පැහැදිලි වේ.

**ප්‍රමුඛ පද :** රජු, ඉඩම් අයිතිය, බලතල

[1,2,3]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
mindyasatsarani@gmail.com